# කියවීමේ අවශ්‍යතා හා කියවීමේ පුරුදු පිළිබඳ හැඳින්වීමක්

බෝදාගම සුමන හිමි

## හැඳින්වීම

කියවීම ප්‍රගුණ කිරීමෙන් පුද්ගලයාට සමාජය තේරුම් ගැනීමටත්, සාර්ථක සමාජ සම්බන්ධතා පවත්වා ගැනීමටත්, සමාජය තුළ ක්‍රියාශීලි සාමාජිකයෙකු වීමටත් හැකියාව ලැබෙයි. "කියවීම යනු චින්තනය හා සම්බන්ධ වන භාෂා හැකියාවන්ගේ එක් අංශයකි. එය භාවිතය, විග්‍රහය, ඇගයීම සහ නිර්මාණය යන අංගයන්ගෙන් සමන්විත වේ. කියවීම මගින් මතුපිට අර්ථය හා ගූඪාර්ථය (වාච්‍යාර්ථය හා ව්‍යාංගාර්ථය) අවබෝධ කර ගැනීමට ඉවහල් වේ." (පිටර්, 1977) "ඉතා විශිෂ්ට ගණයේ අලුත් පොතක් ප්‍රථම වරට කිය වූ විට මට අලුත් මිතුරෙකු හමු වුවා වැනිය. වරක් කිය වූ පොතක් නැවත කියවන විට මට පැරණි මිතුරෙකු යළි මුණ ගැසුණා හා සමාන වේ." (ඔලිවර් ගෝල්ඩ් ස්මිත්) යනුවෙන් චින්තකයන් කියවීම පිළිබඳව විවධ අදහස් ඉදිරිපත් කොට ඇත. "කියවීම මිනිසා සම්පූර්ණ කරයි" (ෆ්‍රැන්සිස් බේකන්) මේ අනුව සමාජයක සමාජ සංවර්ධනය සඳහා කියවීම අත්‍යවශ්‍ය සාධකයක් බව පැහැදිලිය. කියවීම නොමැති වූ කළ සමාජයක පැවැත්ම යහපත් නොවේ. මිනිසා පොතපතින් විශාල දැනුමක් ලබනවා පමණක් නොව හික්මීම, හැදියාව, කුසලතාව, හැකියාව වර්ධනය කර ගැනීම ද සිදු කරයි. එය යහපත් සමාජයක පැවැත්මට බලපායි. එසේම කියවීම සමාජයක පැවැත්මට, එහි සංස්කෘතිය, සම්ප්‍රදායයන් ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා අත්‍යවශ්‍යය වේ.

## කියවීමේ ප්‍රයෝජන

වර්තමාන සමාජය දෙස බැලීමේ දී එය නවීන තාක්ෂණය හා මුසුව පවතින්නක් බව පෙනේ. මෙවැනි සමාජයක ජීවත්වීමේ දී පුද්ගලයා දැනුවත් පුද්ගලයෙකු විය යුතුය. පොත්පත්, සඟරා ආදියෙහි ඇතුළත් කරුණු පුද්ගල සංවර්ධනයට බෙහෙවින් හේතු වේ. පොතක ඇතුළත් වන්නේ කතුවරයාගේ ජීවන අත් දැකීම්, හැඟීම්, සංකල්ප

හෝ පරිකල්පනා විය හැකිය. එමනිසා පොත් කියවීම තුළින් මනවයාට හික්මීම, විනය, සංයමය හා ලේඛන කුසලතා වර්ධනය කර ගැනීමට අවස්ථාව හිමි වේ. මේ අනුව,

- කියවීම මිනිසා සම්පූර්ණ කරයි
- ඉතිහාසය කියවීමෙන් මිනිස්සු නැණවත් වෙති
- තර්කය හා කාව්‍යයාලංකාරයෙන් මිනිසා බුද්ධිමත් කරයි
- දර්ශනය පිළිබඳ සාහිත්‍යය කියවීම මිනිස් සිතුවිලි ගැඹුරු කරයි
- කවියෝ තම කවියෙන් මිනිස්සු චතුර කෙරෙති. (ෆ්‍රැන්සිස් බේකන්)

ඉහත නිර්වචන මගින් පෙන්වා දෙනු ලබන්නේ ද කියවීම පුද්ගලයා සතු දැනුම පුළුල් කර ගැනීමට උපකාරි වන බවයි. එසේම සංස්කෘතියක පැවැත්ම සඳහා ද කියවීම බලපානු ලබයි. සංස්කෘතියක ඇතුළත් සිරිත් විරිත් අනාගත පරම්පරාව සඳහා කියාදීම අවශ්‍යය වේ. එමගින් පුද්ගලයාගේ සාරධර්ම හා ආකල්ප වර්ධනය ද සිදු වේ. පොත පත කියවීමෙන්,

- විනය ගරුක පුරවැසියන් බිහිකිරීම
- දැනුමින් පිරිපුන් ප්‍රජාවක් බිහිකරලීම
- ඉගෙනුම් සමාජයට ප්‍රබල පිටුවහලක් වීම
- දැනුම් සමාජයට ස්ථාවර මාර්ගයක් ඇති කිරීම
- ගැටලු අවම සමාජයක්
- නිර්මාණශිලී හා නව නිපැයුම් තනන පුරවැසියන්
- ගුණාත්මක අධ්‍යාපනයක්
- කියවීම් සංස්කෘතියක්
- ජාතික අභිමානයට මගක් (වීරසූරිය, 2011)

ඉහත දක්වා ඇති අභිමතාර්ථ සාධනය කරනු පිණිස කියවීම වඩාත් වැදගත් වන බව පැහැදිලිය. පුද්ගලයෙකුට කියවීම තුළින් ලබාගත හැකි ප්‍රයෝජන රාශියකි.

- සරල භාෂාවෙන් ලියවුණු, පහසුවෙන් කියවිය හැකි පොතපත මගින් සතුට හා විනෝදය ලබා ගත හැකිය
- යම් විෂයක්/ මාතෘකාවක් මතුපිටින් කියවා සමස්තය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම
- විෂය දැනුම පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ලබා ගැනීමට හැකිවීම
- ප්‍රායෝගික ව්‍යවහාර පිළිබඳ දැනුම පුළුල්වීම
- දුරවබෝධ කරුණු අවබෝධ කර ගැනීම සඳහා වචනයෙන් වචනය කියවීම (අෂ්මන්, 1982)

මීට අමතරව "මාගේ විශ්වවිද්‍යාලය වූයේ කොළඹ මහජන පුස්තකාලයයි. නවතින්නට තැනක් එකල මා හට නොතිබුණි. එක්තරා නෑ ගෙදරක නැවතී උදෑසන හතට පමණ ගෙදරින් පිට වී රෑ දහයට පමණ ආපසු නැවතුම්පොළට යන තෙක්, මා මුළු දවසම ගත කළේ විශ්වවිද්‍යාලයේ කියවීම් ශාලාවේය." (ජී. බී. සේනානායක - උපුටා ගැනීම ලියනගේ, 2012) කියවීම තුළින් සාහිත්‍යයඥයන් බිහිවීම පිළිබඳ එම සටහන කදිම නිදසුනකි. කියවීම ජීවිතයේ කොටසක් කරගත් විට එයින් ලබා ගත හැකි ප්‍රයෝජන බොහෝය. එය පුද්ගලයාගේ දැනුමට පමණක් නොව මුළු මහත් සමාජයේම සංවර්ධනය සඳහා ඉවහල් වන්නකි.

**කියවීමේ අරමුණු**

කියවීමේ අරමුණු පිළිබඳව අවධානය යොමු කළ විට කියවීම එක් එක් පුද්ගලයාගේ අවශ්‍යයතාව හා උවමනාව මත තීරණය වේ. කියවීමේ අරමුණු තීරණය වනුයේ කියවන පුද්ගලයා අනුවය.

- විනෝදාස්වාදය සඳහා කියවීම
- සමාජයේ නව තොරතුරු දැන ගැනීම සඳහා කියවීම
- කාලය ගත කිරීම සඳහා කියවීම
- කරුණු දැන ගැනිම සඳහා කියවීම
- කිසියම් ක්‍රියා මාර්ගයක් වටහා ගැනීම සඳහා කියවීම
- භාෂා ඉගෙන ගැනීම සදහා කියවීම (ප්‍රේමරත්න, 2002)

යම් කෙනෙකු පොත් පරිහරණය කරනු ලබන්නේ ඔහුගේ සතුට හා අවශ්‍යතාවය අනුවය. හෙතෙම විවේක කාලය ගත කිරීමට නවකතා, කෙටිකතා, ප්‍රබන්ධ, සඟරා, සමාජය තුළ අලුතින් සිදු වී ඇති තොරතුරු දැන ගැනීමට පුවත්පත් හෝ කියවිය හැකිය. කියවීමේ තුළින් පුද්ගලයෙකුගේ,

- යහපත් ආකල්ප වර්ධනය
- බොහෝ වේලවක් නෙකඩවා අවධානයෙන් යුතුව රැඳී සිටිමට ඇති හැකියාව
- සමාන - අසමානතා දැකීමේ හැකියාව
- අවකාශයේ සම්බන්ධතා පිළිබඳ අවබෝධය
- පොත් පිළිබඳව ලැදියාව හා කියවීමට දක්වන ආශාව
- කතාවක් කියවන විට ආසාවෙන් අසා සිටීම
- වාචික අණ පිළිපැදීමේ හැකියාව වර්ධනය වේ. (කාරියවසම්, 1984)

**කියවීම සඳහා මූලික වන සාධක**

කියවීම සඳහා අවශ්‍ය වනුයේ මනැස හා ශ්‍රවණේන්ද්‍රියන්ය. මේ සියල්ලෙහි ගැටලුකාරි තත්ත්වයන් නොමැති විය යුතුය. එවිට

වඩා හොඳ කියවීමකට පුද්ගලයාට අවස්ථාව හිමි වේ. "අවධානය නොමැති වීම කියවීම කෙරෙහි සෘණාත්මකව බලපායි. " (කාරියවසම්, 2002) මෙයින් පෙන්වා දෙනු ලබන්නේ අප යම් දෙයක් කියවනවිට එය අවධානයක් සහිතව සිදු කළ යුතු බවයි. ඒ සඳහා මනස නිරවුල් කරගත යුතුය. "ඇස් දෙකකුත් කන් දෙකකුත් ඇති නිසා මොළයේ කොටස් දෙකම සම්බන්ධ වෙයි. මොළයෙහි ඇසෙන් සංඥාවක් ගන්නා දෘෂ්ටි ක්ෂේත්‍රයත්, කනින් සංඥා ගන්නා ශ්‍රවණ ක්ෂේත්‍රයත් සම්බන්ධ කරන ස්ථානයට එනම් සම්ප්‍රාප්ත වේදිකාවට යම් කිසි හානියක් සිදු වුවහොත් බාහික අන්ධභාවය හා බාහික ගොළු භාවය ඇති වේ. එවිට පියවි ඇසින් දැකීමටත්, කනින් ඇසීමටත් අපොහොසත් වේ. එම නිසා ප්‍රකෘති ඇස් හා කන් ඇති වුවත් ඇසට දකින දේත් කනට ඇසෙන දේත් අවබෝධ කර ගැනීමට අපොහොසත් වේ. මීට මානසික අන්ධ භාවය හා මානසික ගොළු භාවය යැයි කියනු ලැබේ." (කාරියවසම්, 2002) මේ අනුව කියවීම සඳහා ඇස, කන, මනස හා ශ්‍රවණේන්ද්‍රියන් යහපත් විය යුතු බව අවධාරණය කර තිබේ. ඉන් එකක හෝ ගැටලුකාරි තත්ත්වයක් පවතින්නේ නම් කියවීම නිසි පරිදි සිදු කළ නොහැකිය. තව ද කියවීම සඳහා මූලික වන ප්‍රධාන සාධකයක් වන්නේ නිසි මගපෙන්වීමයි. ඒ සඳහා නිසි මගපෙන්වීමක් කුඩා කළ සිට ලැබිය යුතුය.

**කියවීමේ පුරුද්ද**

කියවීම පුරුද්දක් ලෙස පවත්වා ගෙන යා හැකිය. එහිදී පුරුද්ද ලෙස සරලව පෙන්වා දිය හැකි වනුයේ නැවත නැවත කරනු ලබන දෙයක් වේ. පොත්පත් කියවීම ද නැවත නැවත සිදු කරනු ලබයි නම් එය කියවීමේ පුරුද්ද ලෙස නිර්වචනය කළ හැකිය. " කියවීම යනු අප ගැනත්, අප අවට ලෝකය ගැනත්, කරුණු වටහා ගත හැකි මාර්ගයක් පමණක් නොව, ලෝකයේ අපට හිමි තැන ද ලබා ගැනීමට උපකාරිවන මාර්ගයකි. වෙනස්වන පරිසරයකට උචිත පරිදි හැඩ ගැසීමට, වඩාත් පරිපූර්ණ හා සමෘද්ධිමත් ජීවිත ගෙන යාමට උපකාරි වන්නේ කියවීමයි. මිනිස් සංස්කෘතියෙහි නොයෙක් අංශ දියුණු කර ගැනීමටත්, නූතන ලෝකයේ ඔවුන්ට හිමි තැන ලබාගැනීමටත් ආර්ථික හා සමාජ දියුණුවටත්, එක්ව සාමයෙන් විසිමටත් කියවීම උපකාරි වේ." (යුනෙස්කෝ උපුටා ගැනීම

අතුකෝරාල, 1985) මේ අනුව කියවීමෙන් පුද්ගලයාට හා සමාජයට යහපත් බලපෑමක් සිදුවන බව පැහැදිලිය.

පුද්ගලයෙකුට කියවීම පුරුද්දක් ලෙස පවත්වාගෙන යාම තුළින් විශාල වාසි රැසක් අත්කර ගත හැකිය. "කියවීමේ පුරුද්ද නිවස තුළින්ම ඇරඹිය යුත්තකි. විශේෂයෙන්ම දෙමාපියන් විසින්ම කුඩා දරුවන්ව මේ සඳහා පෙළඹවීමට කටයුතු කළ යුතුය. මේ සඳහා ශබ්ද නඟා කතන්දර කියවීම, පුස්තකාල නැරඹිම සඳහා රැගෙන යාම, ත්‍යාග සඳහා පොත් ලබාදීම, නිවස තුළ කුඩා කියවීමේ ස්ථානයක් සැකසීම ආදි දෑ කළ හැකිය." (රත්නබාහු, 2011) කියවීමේ පුරුද්ද කුඩා කාලයේ සිට වර්ධනය විය යුතුය. එසේම ඒ සඳහා නිවැරදි මඟ පෙන්වීමක් ද සිදු විය යුතුය. "කෙනෙකු කියවිය යුත්තේ හුදෙක් ඔහුගේ නැඹුරුව අනුවය. දුෂ්කර කටයුත්තක් සේ කියවන දෙයින් ඔහුට ප්‍රයෝජනයක් සිදු නොවේ. "(සැමුවෙල් ජොන්සන්) මේ අනුව තමා කියවන දෙය පිළිබඳව අවබෝධය පැවතිය යුතුය. එසේ නොමැතිව කියවීමෙහි නිසි ප්‍රයෝජන අත් කරගත නොහැක. කියවීම මඟින් පුද්ගලයා දැනුමින් පරිපුර්ණ පුද්ගලයෙක් බවට පත්වෙනවා සේම, සමාජයේ ජීවත් වීමට අවශ්‍යය අවබෝධය හා දැනුම ලබාගනී.

"කියවීම පුද්ගලයෙකු විසින් නිපුණ කළ යුතු චර්යාවකි. ඒ අනුව කියවීම ස්වයංක්‍රීයව පරිණතියේ ප්‍රතිඵලයක් ලෙස ලැබෙන දක්ෂතාවක් නොව පුද්ගලයෙකු විසින් ඉගෙන ගත යුතු, දිගු කලක් මුළුල්ලේ ප්‍රගුණ කළ යුතු ගැඹුරු කෞශල්‍යයක් බව පෙනේ." (අතුකෝරාළ, 1985) මෙමගින් ද පෙන්වා දෙනු ලබන්නේ කියවීම නිරන්තරව සිදුකර වර්ධනය කරගත යුතු පුරුද්දක් වන බවයි. කියවීම පුරුද්දක් වන අතර ම, එය කලාවක් ද වේ. ඇමරිකාවේ මහාචාර්යවරයෙකු වන මනෝවිද්‍යාඥ හැරල්ඩ් ආර්නස්ට් බර්ට් විසින් කියවීම පිළිබඳ සූත්‍රයක් ඉදිරිපත් කොට ඇත.

- S - Survery පිරික්සුම
- Q - Question ප්‍රශ්න
- R - Read කියවීම

- R - Recite තමන් තේරුම් ගත් දේ හඩනගා තමාගේ වචනයෙන් පැවසීම
- R - Review කියවන ලද දේ විමර්ශනය කිරිම (මුතුකුඩ සහ ජයසුන්දර, 2009)

පිරික්සුම - විධිමත්ව කියවීමේ මුලිකම අවධිය වේ. මෙහිදි පුවත්පතක, සඟරාවක නම් මුලින්ම ලොකු අකුරින් සඳහන් කර ඇති, තද වර්ණයෙන් මුද්‍රණය කර ඇති දෑ කියවීම සිදු කෙරේ. පොතක් නම් පොතේ සාරාංශය, පරිච්ඡේදයන්ගේ මුල, පටුන කියවනු ලබයි. එමගින් පොත හෝ කියවන දෑ පිළිබඳව මූලික අවබෝධය ලබා ගත හැකිය. එහි දෙවන පියවර වන්නේ ගැටලුවක් මුල් කොට ගෙන යම් මූලාශ්‍රයක් කියවීමයි. මෙම පියවරේ දී ගැටලුව පිළිබඳව නිවැරදි අවබෝධයක් ලැබෙන තෙක් කොටස් මගනොහැර මූලාශ්‍රය සම්පූර්ණයෙන්ම කියවිය යුතු වේ. තෙවැනි පියවර කියවීම වන අතර එහි ප්‍රධාන කොටස් දෙකකි. එනම්, පෘථුල හා ගැඹුරු ලෙස කියවීමයි. පෘථුල කියවීම යනු විශාල විෂය ක්ෂේත්‍රයක් ආවරණය වන ලෙස කියවීමයි. ගැඹුරු කියවීම යන්නෙන් ගැටපද, ටීකා, ශබ්දකෝෂ, විශ්වකෝෂ ආදිය මගින් විමර්ශනාත්මකව කරුණු සෙවීම අර්ථවත් කෙරේ.

තමා විසින් කියවන ලද දෙය තේරුම් ගෙන අනතුරුව එය තමාගේ ම වචනවලට පරිවර්තනය කොට පැවසීම සිව්වෙනි පියවරට අයත් කාර්යයකි. මෙහි දී යමෙකු පොතක් ළඟ තබා පූර්වයෙන් තමා කිය වූ දෙය දෑස් පියා නැවත එය ම සිහි කිරීම සිදු කරයි. මෙම ක්‍රමය භාවිත කිරීමෙන් යමක් ඉක්මනින් මතකයේ තබා ගැනීමට හැකිවන අතර ම, එය වඩාත් අර්ථාන්විත කියවීම් ක්‍රමයක් ලෙස ද හැඳින්විය හැකිය. පස්වන පියවර නම් කියවන ලද දෑ විවේචනය කිරීමේ හැකියාව ඇති කර ගැනීමයි. මෙහි දී කියවන ලද දෑ හොඳින් මතකයේ තබා ගෙන, එම කරුණුවල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා සිදු කරන උත්සාහය විමර්ශනය නමි.

**කියවීමේ කුසලතාව**

කියවීමේ කුසලතාවය පිළිබඳ විවිධ දාර්ශනිකයන් හා චින්තකයන් විසින් බොහෝ නිර්වචන ඉදිරිපත් කොට ඇත. "කියවීම

පූර්ණ මිනිසෙකු තනයි. සාකච්ඡාව අප්‍රමාද මිනිසෙකු ද, ලිවීම නිවැරදි මිනිසෙකු ද තනයි." (ෆැන්සිස් බේකන්) කියවීම තුළින් මිනිසා දැනුමින් පරිපූර්ණ වූ පුද්ගලයෙකු බවට පත් වන අතර තමා විසින් සොයා ගන්නා ලද කරුණු අනෙකුත් පුද්ගලයන් සමඟ සාකච්ඡා කිරීමෙන් දැනුම වර්ධනය කර ගනී. වර්ධනය කරගත් දැනුම ලියා දැක්වූ විට එය නිවැරදිව තේරුම් ගත හැකිය. මේ සියලු දෙයෙහි එකතුව රඳා පවතින්නේ තමා සතුව පවතින කියවීමේ හැකියාව මත බව පැහැදිලිය. මේ අනුව කියවීමේ කුසලතාව යනු යමක් කියවා ගැනීමට ඇති හැකියාවයි. විශේෂඥයන්ට අනුව කියවීමේ කුසලතා වර්ධනයට අනුගමනය කළ හැකි වැදගත් පියවර පහකි. එනම්.

**01. සමීක්ෂණය**

අදාළ කෘතිය විවේචනාත්මකව සමීක්ෂණය සඳහා මාතෘකා, උපමාතෘකා, කර්තෘ, ප්‍රකාශිත දිනය, සූචිය, පරිච්ඡේද, සාරාංශය ආදි ප්‍රධාන ග්‍රන්ථවිද්‍යාත්මක තොරතුරු සැලකිල්ලෙන් කියවා අවබෝධය ලබා ගැනීමයි.

**02. ප්‍රශ්නකරණය**

කියවීමේ කාර්යක්ෂමතාවය සහ අවධානය සඳහා අනාවරණය කර ගැනීමට අවශ්‍යය කරුණු පිළිබඳ තමාගෙන් ම ප්‍රශ්න කිරීම.

**03. කියවීම**

ඡේදයක් කියවීමේ දී එම ඡේදයේ පළමු සහ අවසාන වාක්‍යය කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම වැදගත්ය. එමඟින් ඡේදයේ මූලික හරය පිළිබඳව අවබෝධය ලබා ගත හැකිය. පොතක් පහසුවෙන් කියවීම හා අවබෝධ කර ගැනීම සඳහා යොදා ඇති රූප සටහන් සිතියම් වැනි දෘශ්‍යාධාර කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. අවධානයෙන් කියවා අවබෝධ කර ගැනීමෙන් පසු සටහන් ලියා තැබීම ඉතා වැදගත්ය.

**04. සිහිපත් කිරීම**

කෘතියක් කවර අරමුණක් සඳහා ලියන ලද්දක් ද, මුලින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට හැකි වී ද, අවශ්‍යය වැදගත් කරුණු ස්මරණය කර නැවත කිය වූ ග්‍රන්ථය සමග සසදා බැලීම.

**05. ගුණදොස් විවේචනය**

ඉහත සඳහන් කරුණු හතර පිළිබඳව විවේචනාත්මක විමසීම අවසන් පියවර වේ. කියවීමෙන් උපරිම ඵල ලබා ගැනීමට නම් කියවන්නාගේ වාග් මාලාව පුළුල් විය යුතුය. (විලියම්ස්) කියවීමට ඇති හැකියාව කියවීම් කුසලතාව වේ. ඒ පිළිබඳව පහතින් දක්වා ඇති කරුණු ඊට නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය.

- ඥාන මණ්ඩලය පුළුල් වීමෙන් බාහිර ලෝකය පිළිබඳ පරිඥානය ලැබ මානසික පූර්ණත්වයට පත් වීම.
- දැනුම, තොරතුරු, කුසලතා, ඉගෙනුම, පුරවැසි පුහුණුව, හා රසඥතාව ආදියෙන් පිරිපුන් වීම.
- අධ්‍යාපන කාර්යයේ මෙන්ම අවිධිමත් අධ්‍යාපනයේ මූලික පදනම කියවීමේ හැකියාව බවට පත් වීම හා කියවීමෙන් තොරව අද්‍යතන තොරතුරු සමාජයේ ජීවත් විම අපහසු විම.
- ශ්‍රව්‍ය, දෘශ්‍ය මාර්ගයෙන් ලබා ගන්නා වු දැනුම ස්ථිර කර ගැනීමට අවශ්‍යය පදනම නිර්මාණය විම.
- කියවීමේ කුසලතාව ප්‍රගුණ කළ විට වැදගත් කෘතිවලින් නොවැදගත් කෘති වෙන්කර ගැනීමට හැකි වීම හා තම අරමුණු සාක්ෂාත් කර ගැනීමට කිනම් කෘති විය යුතු ද යන්න නිගමනය කර ගැනීමට හැකිවීම. (තිස්ස, 2012)

**කියවීමේ වේගය**

කියවීමේ වේගය නම් පුද්ගලයාට කියවිය හැකි ප්‍රමාණය වේ. එහි දි කියවනු ලබන දෙය අවබෝධ කර ගැනීම හා මතකයේ තබා

ගැනීම අවශ්‍යය වේ. "කියවීමේ වේගය නම් දක්ෂ කියවන්නා සෑම දෙයක්ම එකම වේගයකින් නොකියව යුතුය. හොඳ කියවන්නා තමා බලාපොරොත්තු වන අරමුණ අනුව වේගය තීරණය කරයි. විනෝදය සඳහා කියවන්නා තමා බලාපොරොත්තු වන අරමුණ අනුව වේගය තීරණය කරයි. විනෝදය සඳහා කියවන්නා ඉගෙනීමට කියවන්නාට වඩා වේගයෙන් කියවීම සුදුසු ය." (බී. රොබට්) වර්තමාන ලෝකයේ පුද්ගලයන්හට කාලය ඉතාමත් වටිනා සම්පතක් වේ. මෙවැනි පසුබිමක් මත ඔවුන්ගේ දෛනික කටයුතු සමග පොතපත කියවීමට වෙන් කර ගත හැකි වන්නේ සීමිත කාලයකි. එවැනි තත්ත්වයක් තුළ කියවීමේ වේගය නිසි පරිදි වර්ධනය කරගත් පුද්ගලයාට එයින් විපුල ඵල අත්කර ගත හැකිය. කියවීමේ වේගය වර්ධනය කර ගැනීම කළ යුත්තේ කියවීම මගින්මය.

කියවීමේ වේග පරික්ෂණය (කියවීමේ වේගය මිනිත්තුවකට)

| වචන සංඛ්‍යාව | දක්ෂතාවය |
|---|---|
| 100 - 200 | සාමාන්‍යය (පහළ) |
| 200 - 300 | සාමාන්‍යය (පහළ-මධ්‍යස්ථ) |
| 300 - 400 | සාමාන්‍යය |
| 400 - 500 | සාමාන්‍යය (ඉහළ) |
| 500 - 600 | ඉතා හොඳ |
| 600 වැඩි | විශිෂ්ට (කාලාතුරකින් දැකිය හැකි) |

(සමරසිංහ, 1996)

පොතක් ඉක්මනින් කියවීම සඳහා පහත දැක්වෙන කරුණු වැදගත් වේ.

- පිටු කීපයක් කියවීම සඳහා යම් කිසි කාල සීමාවක් වෙන් කිරීම.

- ඉක්මනින් කියවීමට ඇස් පුහුණු කර ගැනීම.
- ප්‍රධාන අදහස කෙරෙහි අවධානය යොමු කිරීම.
- යම් කිසි කාල සීමාවක් තුළ කියවන වචන ප්‍රමාණය දියුණු කර ගැනීම.
- කියවීමේ වේගය ගැන වාර්තාවක් තබා ගැනීම.
- නියමිත වේලාවක් තුළ කිසියම් කොටසක් කියවීමට පුරුදු වීම.
- ඇසත් කියවන පොතත් අතර අඩියක අවම දුරක් පවත්වා ගැනීම.

කියවීම සිදු කළ යුත්තේ යම් සංයමයක් සහිතවය. එසේම මනස නිරවුල් කොට ගෙන නිසි ස්ථානයක සිට කියවීම සිදු කළ යුතුය. වේගයෙන් කියවන විට එය අවබෝධ කර ගැනීමේ හැකියාව ද පැවතිය යුතුය.

**කියවීමේ ප්‍රභේද**

කියවීම විවිධ වූ ආකාරයෙන් සිදු කළ හැකි වේ. ඒ සඳහා අනුගමනය කළ හැකි ආකාර කිහිපයක් පහතින් දක්වා ඇත.

- හඬනගා කියවීම
- නිහඬ කියවීම
- විමර්ශනාත්මක කියවීම

**හඬනගා කියවීම**

හඬනගා කියවීම නම් කියවන දෑ තමාට පමණක් නොව අසළ සිටින අනෙකුත් පුද්ගලයන්ට ඇසෙන සේ උච්ඡස්වරයෙන් කියවීමයි. හඬනගා කියවීමෙන් කියවන ලද දෑ මතකයේ තැන්පත්වන බවට විද්‍යාත්මක මතයක් ද වේ. කියවන්නෙකුට හඬ නගා කියවීම මඟින් පහත ප්‍රයෝජන ලබා ගත හැකිය.

- ශබ්දකෝෂය වර්ධනය වීම
- නිවැරදි බස හුරුවීම
- විෂය කරුණු පිළිබඳ දැනුමක් ලබා ගැනීම
- නිවැරදි උච්චාරණයට පුහුණු වීම

මෙලෙස හඬනගා කියවීම තුළින් පුද්ගලයාට භාෂා හැකියාව වඩාත් හොඳින් වර්ධනය කරගත හැකිය; වඩාත් හොඳ ධාරණ ශක්තියක් හා මනස එක් ස්ථානයක තබා ගෙන කටයුතු කිරීමේ හැකියාව ඇති වේ; යමක් කියවා ගත නොහැකි පුද්ගලයන්යන්ට අසා සිටීමෙන් ඒ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකියාව ලැබේ.

**නිහඬ කියවීම**

නිහඬ කියවීම යනු යම්කිසි ලේඛනයක් දෙස බලා එය මනසින් හා ඇසින් පමණක් කියවීම වේ. මෙහි ප්‍රතිඵල අත්පත් කරගත හැකිවනුයේ කියවන ලබන පුද්ගලයාට පමණි. නිශ්ශබ්දව කියවීමේ අවස්ථා 03 කි.

- සංවර්ධන කියවීම - පෙළ පොත් කියවීම
- ආශ්‍රේය කියවීම - විෂයානුබද්ධ කියවීම
- විනෝදාත්මක කියවීම - පුද්ගලික රුචිකම් අනුව නිදහසේ කියවීම

නිහඬ කියවීම තුළින් වචන උච්චාරණය කර ගැනීමේ දී ගැටලු මතු විය හැකිය. එයට හේතු වනුයේ එම වචන උච්චාරණය නොකර මනසින් පමණක් තේරුම් ගැනීම උත්සාහ කිරීම නිසාවෙනි. කෙසේ නමුත් නිහඬ කියවීම බොහෝ දෙනා අනුගමනය කරන ප්‍රධාන කියවීම් ක්‍රමයකි.

**විමර්ශනාත්මක කියවීම**

විමර්ශනාත්මක කිවීමේ දී පූර්වාපර සන්ධි ගලපමින් විශ්ලේෂණාත්මකව හා සංශ්ලේෂණාත්මකව අධ්‍යයනය කරනු

ලැබේ. මෙමගින් කියවනු ලබන දෑ පිළිබඳව පූර්ණාවබෝධයක් ලබා ගැනීමේ හැකියාව පවති; කියවන දෑ ගැඹුරු මතකයේ තැන්පත් වේ. විමර්ශනාත්මක කියවීම සඳහා භාවිත කළ හැකි ක්‍රම තුනක් (03) ඇත.

- සංශ්ලේෂි ක්‍රමය.
- විශ්ලේෂි ක්‍රමය.
- විශ්ලෙෂි - සංශ්ලේෂි ක්‍රමය. (යුනෙස්කෝ වාර්තාව, 1964.)

**සංශ්ලේෂි ක්‍රමය**

මෙම ක්‍රමය යටතේ පළමුව භාෂාවේ වචන ශබ්ද කිරීම හා උච්චාරණය වැනි මූලික කරුණු ඉගෙන ගැනීම සිදු කරනු ලබයි. අනතුරුව වචන ගලපා වාක්‍යය නිර්මාණය කිරීමට හා පසුව පොත් කියවීමට ද පාඨකයා යොමු වේ.

**විශ්ලේෂි ක්‍රමය**

විශ්ලේෂි ක්‍රමයේ දී කියවන්නා වචන, තොරතුරු ගළපමින් කරුණු සොයා යන අතර, ගුරුවරයා කියා දීමට පෙර පොත්පත් භාවිත කොට අවශ්‍ය තොරතුරු සොයා ගනී.

**විශ්ලේෂි සංශ්ලේෂි ක්‍රමය**

වාක්‍යය රටා හඳුනා ගෙන එයින් කියවෙන දෙය පිළිබඳ මූලික අවබෝධය ලබා ගනී. භාෂාවේ මූලික ලක්ෂණ මෙන්ම කියවීමේ උපක්‍රම ද ඉගෙන ගනී.

**කියවීම ප්‍රවර්ධනය කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග**

සමාජයේ පවතින දැනුම පිළිබඳ විෂමතා වළක්වා ගැනීමට නම් කියවීම සමාජය තුළ ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍යය. එසේම කියවීමේ මුලාරම්භය සවිමත් කළ යුතුය. එසේ නොමැතිව කියවීම වර්ධනය කළ නොහැක. සෑම කෙනෙකුගේ ම කියවීමේ පුරුද්ද ආරම්භ වන්නේ සිය නිවස කේන්ද්‍රවය. එම නිසා කුඩා අවධියේ සිට ම නිවස තුළ ඒ සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කළ යුතුය. එවිට

දරුවා එය තම ජීවිතයේ කොටසක් බවට පත්කර ගනී. ඔහු වැඩිවියට පැමිණිය ද එම පුරුද්ද අත් නොහරී. ඉනික්බිතිව දරුවාට පාසල් පුස්තකාලය භාවිත කිරීමට පාසලේ පුස්තකාලයාධිපති හා විදුහල්පති මගපෙන්විය යුතුය. පුස්තකාල භාවිතය සඳහා කාලච්ඡේද වෙන් කර දියයුතුය. කුඩා දරුවන්ගේ කියවීම් පුරුදු සංවර්ධනය සඳහා සඳහා කතන්දර පැය, ප්‍රදර්ශන, පාඨක සමාජ, වාද විවාද පැවැත්වීම ආදි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුව ඇත. මීට අමතරව කියවීම ප්‍රවර්ධනය කිරිම සඳහා රටක පුස්තකාල සතුව ද විශාල වගකීමක් පැවරී තිබේ. පුස්තකාල පිහිටු වීමෙන් පාඨකයාගේ කියවීම ප්‍රවර්ධනය කිරීම වේ. එසේම කියවීම ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද අද වන විට දක්නට ලැබේ. ඒ තුළින් ද කියවීම වර්ධනය කොට ඒ හරහා සමාජ සංවර්ධනය අපේක්ෂා කරයි. ලංකාව තුළ පමණක් නොව අනෙකුත් බොහෝ රටවල මෙම කියවීම සංවර්ධනය සඳහා කුඩා දරුවාගේ සිට වැඩිහිටි පුද්ගලයා දක්වා විවිධ ප්‍රයෝගික න්‍යායාත්මක ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

- ළමා පුස්තකාල  ක්‍රමයක් දියත් කිරීම
- පාසල් පුස්තකාල සමග සහයෝගීතා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- පුස්තකාලවලට ග්‍රන්ථ කර්තෘවරුන් ගෙන්වා කරන වැඩ සටහන්
- ත්‍යාග ප්‍රදානය මඟින් කියවීම් ප්‍රවර්ධන වැඩ සටහන් පැවැත් වීම
- පාඨක සමාජ
- කතන්දර පැය
- ග්‍රන්ථ විවේචන
- පොත් ප්‍රදර්ශන
- ත්‍යාග සහ නිර්මාණ සංදර්ශනය (විරසූරිය, 2011)

මෙලෙස කියවීම ප්‍රවර්ධනය සිදු කිරීමට ගත හැකි පියවර බොහෝය. එසේම වර්තමානයේ නව තාක්ෂණික ශිල්පීය ක්‍රම ද, කියවීම ප්‍රවර්ධනය සඳහා සඵලව යොදා ගත හැකි වේ. "ඉලෙක්ට්‍රොනික මාධ්‍යය ද මෙහි දී වැදගත් මෙහෙයක් ඉටු කරයි. පාඨකයෙකුට අවශ්‍යය වන අදහස් හා කරුණු ගොඩනගා ගන්නට චිත්‍රපටයටත්, රේඩියෝවටත්, රූපවාහිනියටත් දිය හැකි සහාය අතිමහත්ය.

**කියවීමේ බාධා**

උපයෝජකයාගේ කියවීම කෙරෙහි බලපාන සමාජ, ආර්ථික බාධා ගණනාවක් ඇත. "අවිවේකී ජීවන රටාව එක් ප්‍රධාන බාධාවකි. තම මූලික අවශ්‍යයතා ඉටුකර ගැනීම සඳහා තරගකාරී ජීවන ක්‍රමයකට ජනතාව යොමු වී සිටිති. කියවීම ජනතාවගෙන් ඈත් වීමට මෙම තත්ත්වය බල පා ඇත." (අමරසිරි, 2011) මීට අමතරව "විද්‍යුත් මාධ්‍යයන්ගේ සීඝ්‍ර දියුණුව පාසල් සිසුන්ගේ කියවීමේ රුචිය අඩු කිරීමට බලපෑ තවත් එක් හේතුවක් ලෙස දැක්විය හැකිය. ටෙලි නාට්‍යය මඟින් සමාජයේ විවිධ විෂමතා ගෙනහැර දක්වමින් සමාජයට යම්කිසි මෙහෙවරක් ඉටු කරන බවට යමෙකුට තර්ක කළ හැකි නමුත් පොතපත කියවීමෙන් ලැබෙන දැනුම හා වින්දනය ඊට වඩා උසස් මට්ටමක පවතී. එමෙන්ම කියවීම තුළින් පරිපූර්ණ දැනුමකින් හා කුසලතාවකින් හෙබි අනාගත පරපුරක් ද බිහිවනු ඇත. " (අතපත්තු, 1994) මෙයින් පෙන්වා දෙන්නේ පොත පතින් ලබන දැනුම අනෙකුත් මාධ්‍යයන් මඟින් ලබා ගන්නා දැනුමට වඩා අර්ථවත් වන බවයි. රූපවාහිනිය සඳහා බොහෝදෙනා තමාගේ කාලයෙන් වැඩි කොටසක් වෙන් කරනු ලබයි. නමුත් එම මුළු කාලය තුළින්ම ලබා ගන්නා දැනුම පොතපතින් ලබා ගන්නා දැනුම තරම් ප්‍රමාණාත්මක නොවේ; එසේම ගුණාත්මක ද නොවේ. ළමයා කියවීමට පුරුදු වන අවධියෙහි ළමයාගේ මානසික මේරීම ගැනත් විශේෂයෙන් සැලකිය යුතු බව ඩබ්. අයි. තෝමස්, සිග්මන් ප්‍රොයිඩ් සහ ඩබ්. යූ. වොල් ද වැනි අධ්‍යාපන මනෝවිද්‍යාඥයන් ප්‍රකාශකර තිබේ. මානසික මේරීම ගැන පැහැදිලි චිත්‍රයක් නොදැක ළමයා කියවීමට පුරුදු කිරීමට යාම නිසා ළමයාට මානසිකව අවුල් තත්ත්වයක් ඇති වීමට හොඳටම ඉඩ ඇත. අවසාන ප්‍රතිඵලය ළමයාගේ අනාගතය පවා බිඳ වැටේ." (සංසදාස, 1983) කියවීම අත්‍යවශ්‍යය වුවත් එය නිවැරදි ආකාරයෙන් ලබා දීම

සිදු කළ යුතුය. එසේ නොමැතිව කියවීම තුළින් පුද්ගලයා යහපත් පුද්ගලයෙකු බවට පත් කරගත නොහැක. මීට අමතරව කියවීම සඳහා පවතිව බාධකයක් වන්නේ සෞඛ්‍යයමය දුර්වලතා වේ. අන්ධභාවය, ගොළුබව, වයසට යාමත් සමග ඇතිවෙන ඇස් නොපෙනී යාම, විවිධ ලෙඩ රෝග, අයහපත් මානසික තත්ත්වයන් නිසා කියවීමට බොහෝ බාධා ඇති වේ.

## සමාලෝචනය

කියවීම වනාහි කලාවකි. ඒ සඳහා නිසි මගපෙන්වීමක් කුඩා අවධියේ සිට ම ලැබිය යුතු බව අධ්‍යාපන මනෝවිද්‍යාඥයින්ගේ මතයයි. එමනිසා කියවීමේ අරමුණු හා ප්‍රයෝජන පිළිබඳව උපයෝජකයා දැනුමත් කිරීම අත්‍යවශ්‍ය වේ. යම් සමාජයක කියවීම පුරුද්දක් ලෙස මුල් ළමාවියේ සිට සංවර්ධනය වන්නේ නම්, එම සමාජය තුළ ගැටුම් අවම වේ. එසේම උසස් රසවින්දනයක් සහිත සබුද්ධික පිරිසක් නිර්මාණය කර ගැනීමේ හැකියාව පවති. මෙම ලිපියෙන් පුද්ගලයෙකුගේ කියවීම් පුරුදු සංවර්ධනය උදෙසා උපයෝගී කරගත හැකි ශිල්පීය ක්‍රම පිළිබඳව උදාහරණ සහිතව කරුණු සාකච්ඡා කර ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අකරවිට, පද්මා (2005). කියවීමේ පුරුදු වර්ධනය, *පුස්තකාල හා විඥාපන විද්‍යා ලේඛන සමුච්චය*, කැළණියඃ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය.

අතපත්තු, සේනාරත්න (1994). කියවීමේ රුචිකත්වය නන්වාලන වැඩ පිළිවෙලක් අවශ්‍යයි, *දිවයින*, නොවැ. 19. පි. 8.

අතුකෝරළ, දයාරෝහණ, (1985). කියවන ලොවකට පියවර, *පුස්තකාල ප්‍රවෘත්ති*, 6 ( 3/4), පි.9 - 10.

අමරසිරි, ජී. ඩී. (2011). දැනුම පාදක කරගත් සමාජය තුළ කියවීමේ වැදගත්කම, *දිවයින*, ඔක්. 20. පි.

කාරියවසම්, ටී. (1984). *සාර්ථක කියවීම*, කොළඹඃ ස්පීඩ් ප්‍රින්ටර්ස්.

ගමගේ, රුවන් (2011). කියවීම එදා සහ අද, කොළඹඃ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ගුණසේකර, ධනපාල (1998). *පුස්තකාල සේවාවේ මූලිකාංග*, කොළඹඃ ගොඩගේ.

තිස්ස, ආනන්ද ආර්. ඩී. (2012). කියවීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීම පිණිස පුස්තකාල සේවාව සතු කාර්යය භාර්යය හා වගකීම: *දේශීය සම්භාව්‍යය අධ්‍යාපන සම්ප්‍රදාය ඇසුරෙන් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි*, කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ප්‍රේමරත්න, අශෝක (2000). *කියවීමට පෙරහුරුවක්,* කොළඹ: ගොඩගේ.

මුතුකුඩ, ජුඩ් සහ ජයසුන්දර, මෛත්‍රි (2009). *පුස්තකාල හා විඥාපන විද්‍යාව සංකල්ප හඳුන්වාදීම:* සාමාන්‍යයාවබෝධය, කොළඹ: ගොඩගේ.

යුනෙස්කෝ සංවිධානය (1964). *කියවීමට ඉගැන්වීම*, කොළඹ: රාජ්‍යය භාෂා දෙපාර්තමේන්තුව.

ලියනගේ, උදය ප්‍රසාද් (2012). *කියවීම මිනිසා සම්පූර්ණ කරයි*, http://www.wikasitha.com

වීරසූරිය ඩබ්. ඒ. (2011). *කියවීම සංවර්ධනයට මාවතයි*, කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය.

ස්ටෛයිගර් සී. රල්ප්, (1991). *කියවීමට මග*, යුනෙස්කෝ කුරියර්, ජනවාරි පි. 28.

සමරසිංහ, සී. (1996). *ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් පළමුවන වසර සිසුන්ගේ භාෂා හැකියා මැනීම සහ ඇගයීම් සඳහා පරීක්ෂණ කට්ටලයක් සකසා සම්මත කිරීම පිළිබඳ අධ්‍යයනයක්.* ශාස්ත්‍රවේ දී පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන), කොළඹ: කොළඹ විශ්වවිද්‍යාලය.

සංසදාස, කේ. ජී. (1983). *කියවීමේ රුචිය වඩන නව ශිල්පීය ක්‍රම*, දවස, 1983 සැප්තැම්බර් 14.

හිරිපිටිය, ජයන්තා චන්ද්‍රානි, (1989), කොළඹ: කොළඹ පොත් සමාගම.

Sahman, A.F. (1982). *Using Cognitive Methods in Classroo*, Lodon: Oxford Univeresity Press. 11 -19 p.

Artley, A. S. (1961). *What is Reading*, Chicago: Scott Foreseman.

Hanson, E. L. (1957). *Looking, Listening and Learning Illutrted*, London: Hulton Educationl Publiction.

Imass, (1952). *The teaching of English: Issued by the Incoporated Association of Assistant Master in Secondary Schools*, Cambridge.

Peter, Pumerey D. (1977). *Measuring Reading Abilities*, London: Hodder and stonghton.